

# අපි නත්තලේ සැබෑ අරුත යළි සොයාගෙන
# එය මහත් ගරුත්වයෙන් සමරමු!

අරුත්බර නත්තලක් උදෙසා...
අව්‍යාජ නත්තල් වන්දනාවක්...

යෝජනා සහ නිර්දේශ කිහිපයක්



ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

නත්තල අර්ථාන්විතව සැමරීම සඳහා තබන්නා වූ පළමු පියවර වශයෙන්, අපි නත්තල සමරන්නා වූ විධි කීපයක් නැවත පරීක්ෂා කොට, දෙවියන් වහන්සේ සියල්ලෝමව ගැලවීම ලබා, සමාජය නපුරෙන් නිදොස් කොට, ජීවනය එහි පූර්ණත්වයෙන් ලබා, සදාකාල ජීවනයේ පොරොන්දුව උරුම කර ගැනීම සඳහා, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ මිනිස් බව පවරා ගැනීමේ ශුද්ධ වූ, පූජනීය වූ සිද්ධියේ සැබෑ අරුත යළි අත්පත් කරගනිමු.

නත්තල, මෑත කාලයන්හී දී එහි සැබෑ ස්වභාවයට හානි කරමින්, බොහෝ දුරට වාණිජකරණය වී ඇත. එබැවින් අපට නත්තලේ සැබෑ ප්‍රීතිය සහ සන්තෝෂය යළි සොයා ගැනීමට හැකියාව ලබා දී පමණ ඉක්මවා උත්සවශ්‍රීයෙන් වැලකී සිටීම සඳහා ප්‍රායෝගීක ඉඟි කිහිපයක් අපි මෙහි ඉදිරිපත් කරන්නෙමු. (මෙහි ඇතුළත් කර ඇති දේ බලන්න.)

අපි මේ නිහතමානි යෝජනාවන් කරන ගමන්, නත්තල් කාලයේ දී ළමයින් අතර ගොඩනැගෙන්නා වූ බලාපොරොත්තු පිළිබඳව ද සබුද්ධිකව සිටින්නෙමු. අපි ඔවුන්ගේ ප්‍රීතිය අහිමි කිරීමට අදහස් නොකරමු. නමුත් අපි ඔවුන්ට මෙම මහා සිද්ධියේ සැබෑ අර්ථ අත්දැක, සදාකාලිකව පවතින ප්‍රීතිය සමාය ලබාගැනීම සඳහා නත්තලේ සැබෑ අර්ථය සොයා ගැනීමට හැකියාව ලබාදීමට බලාපොරොත්තු වෙමු.

- මෙම සාමයේ අවධාරනය කළ යුතු මූලික බයිබලීය සත්‍යයන් කිහිපයක්.
  - ජේසුස් වහන්සේ පැමිණියේ අපව අපගේ පාපයන්ගෙන් ගලවා සමාජ නපුරේ සෑම බන්ධනයකින්ම මුදවාගැනීම සඳහාය.
  - උන් වහන්සේ ඉපදුනේ ගව ගාලකය. එතුමාට තානායමේ ඉඩක් තිබුණේ නැත.
  - ජේසු සමිඳු, තමන්ම සියලු බලයෙන් සහ අධිකාරිත්වයෙන් හිස්කර දාසයෙකුගේ ස්වරූපය ගත්, දෙවියන් වහන්සේය.
  - ජේසුස් වහන්සේ වනාහි දේශපාලනික වංචනිකත්වය නිසා පළාගිය සරණාගත දරුවෙකි.

මෙම කාලයේදී අප යළි අත්පත් කරගත යුතු බයිබලීය පාඨ සහ තේමා සමහරක් සහ අප මෙනෙහි කළ යුතු දේ පහත දැක්වෙන පරිදි සම්පිණ්ඩනය කළ හැක.

| | |
|---|---|
| *ලූක් 1:46-55* | *"උන්වහන්සේ, තම සේවකයාගේ පහත්කම ගැන ප්‍රසාදයෙන් බැලූ සේක... ඉතා බලවත් එතුමාණන් මහත් දේ කළ සේක. පහත් අප ඔසවා තැබූ සේක."* |
| *මතෙව් 2:21-23* | *"උන්වහන්සේ, තමන්ගේ නිවස ගලීල ප්‍රදේශයේ නාසරෙත් කියන්නා වූ සුළු නගරයේ ඇති කරගත් සේක."* |
| *ලූක් 2: 6-7* | *"ඇය උන්වහන්සේව රෙදි වලින් ඔතා ගව ඔරුවක තැන්පත් කළ සේක."* |
| *මතෙව් 2: 13-15* | *"ඔහු දරුවා සහ ඔහුගේ මව රාත්‍රියේ දී රැගෙන ඊජිප්තුවට ගියේය."* |
| *ජොහාන් 13:16* | *"දෙවියන් වහන්සේ ලෝකයට මහත්සේ ආදරය කළ බැවින් තමන්ගේ එකම* |

*පුත්‍රයා දුන්සේක."*

*පිලිප්පිවරු 2: 5-11* *"උන්වහන්සේ වහලෙකුගේ ස්වරූපය දක්වා තමන් හිස් කර ගත් සේක."*

*එළිදරව් 22: 13-17* *"දීප්තිමත් උදෑසන තරුව ජීවන දිය ත්‍යාගයක් හැටියට ය."*

නත්තලේ අරුත යළි අත්පත් කරගෙන අපගේ සැමරීම් උචිතව කිරීමට අපට හැකියාව ලබාදීමේ අරමුණින් කරන යෝජනා කිහිපයක් පහත සඳහන් පරිදිය.

**A. සමූහයන් සඳහා (සභාභවන්)**

- ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත පමණක් ගැන නොව උන්වහන්සේ යළි පැමිණීම ගැන ද මෙනෙහි කිරීමට මෙන්ම, ආගමන (Advent) සමයට යාච්ඤාවෙන් යුක්තව ඇතුල්වීම සඳහා, නොවැම්බර් මාසයේ දී (පෝය දින හෝ ඔබට පහසු වෙනත් දිනක සිට) පවත්වන්න. ආගමන (Advent) වනාහී ලොවට වැඩි ක්‍රිස්තුස් පමණක් නොව අප මහත් බලාපොරොත්තුවෙන් සිටින්නා වූ ක්‍රිස්තුස් වහන්සේගේ අවසාන පැමිණීම ද අප සමරන්නා වූ කාලයකි.

- සරලත්වය, යාච්ඤාව, වන්දනාමානය - සාමයේ කුමරා සැමරීම නත්තල් සිද්ධියේ අත්‍යවශ්‍ය අංගයක් බව අවධාරණය කරන දේශනා අඩු වශයෙන්, දෙකක්වත් නොවැම්බර් මාසයේ දී පවත්වන්න.

- සුඛෝපබෝගී හෝටල් වල පවත්වන අනවශ්‍ය උත්සවයන්ගෙන් ද රාත්‍රී භෝජන සංග්‍රහයන් ගෙන් ද ආලිංගන නැටුම් වලින් ද විනෝද මේලා (Fun Fair) වලින් ද බැහැරව සිටීමට ඔබගේ සාමාජිකයන් දැනුවත් කර උනන්දු කරන්න.

- මත්පැන් වලින් වැලකී සිටීම පිළිබඳව ඔබගේ සාමාජිකයන් අතර දැනුවත්වීමක් කරන්න.

- නත්තල් කියන්නේ සාප්පු සවාරියන් පමණක්ම නොවන බව ඔබගේ සාමාජිකයන්ට වටහා දෙන්න.

- දේවස්ථාන ප්‍රජාවක් හැටියට අවම වශයෙන් පැල පහක් (5) දේවස්ථාන භූමියේ හෝ පොදු ස්ථානයක රෝපනය කර ඉදිරි වර්ෂය පුරා ඒවා ආරක්ෂා කරන්න, පෝෂණය කරන්න.

- සුළු සේවකයන් වන කාර්යාල, පාරවල් පවිත්‍ර කරන්නන් සහ කසල බැහැර කරන්නන් වැනි අය සමග නත්තලේ ප්‍රීතිය සහ සන්තෝෂය බෙදාගැනීමේ අරමුණින් ඔවුන්ව ඔබගේ නත්තල් වැඩසටහන් වලට එකතුකර ගැනීමට ඇති හැකියාව සොයා බලන්න.

- ආබාධ සමඟ ජීවත් වනඅය ඇතොත් ඔවුන්ට ඔබගේ නත්තල් දේව

මෙහෙයට සහභාගී කරගැනීමට උත්සාහ කරන්න.

- සරණාගත ජේසු බිළිඳා දෙසට අවධානය යොමුකර ඔබගේ සහයෝගය සහ යාච්ඤා සරණාගත හා අවතැන් වූවන් කෙරෙහි ලබා දෙන්න.

**B. පවුල් සඳහා**

- ගෘහ මූලිකයා විසින් සියලු සාමාජිකයන්ට, නත්තලේ සැබෑ අරුත පැහැදිලි කිරීමට අවස්ථාව සැලසෙන පවුලේ කෑම වේලක් නොවැම්බර් මාසයේ අග හෝ දෙසැම්බර් මාසයේ මුල පවත්වන්න. (පාස්කු භෝජනයේ සම්ප්‍රදාය අනුගමනය කරමින්)

- මෙම සමයේ වැඩිහිටියන් බැහැ දැකීමට යාම සහ ඔවුන්ට ඔබ පවුලත් සමඟ එකතුවීමට ආරාධනා කිරීමට මතක තබාගන්න.

- හෝටල් වල සහ සමාජ ශාලා (clubs) මඟින් පවත්වන සුඛෝපභෝගී සම්භාෂන සහ නැටුම් සහිත රාත්‍රි භෝජන ප්‍රතික්ෂේප කරන්න.

- නත්තල් කේක් සෑදීමට පෙර සිතන්න.

- ඔබගේ දරුවන්ට අලුත් ඇඳුම් සහ සෙල්ලම් බඩු අරන්දෙන්න. නමුත් සෑම විටම සරලබවේ සහ බෙදාහදා ගැනීමේ වැදගත්කම ඔවුන්ට වටහා දෙන්න.

- ඔබගේ අසල්වාසීව සිටින දුප්පත් ළමයෙකුගේ අවශ්‍යතාවයන් ඉෂ්ට කිරීම සඳහා දෙසැම්බර් මාසයේ දෛනිකව අවම වශයෙන් රු. 10/-ක් ඉතිරි කිරීමට ඔවුන්ව උනන්දු කරන්න.

- ආබාධ සහිතව ජීවත්වන අය වෙත වැඩි අවධානයක් යොමු කර ඔවුන්ව ඔබගේ පවුල තුළට ඒකාබද්ධ කර ගන්න.

- ඔබගේ ගෙවත්තේ හෝ අසලක, පැලයක් රෝපණය කර එය පෝෂණය කරන්න.

- ඥාතීන් ඇතුළු අනෙකුත් වැඩිහිටියන් නත්තල් දින ඔබගේ නිවසට ආරාධනා කිරීමට අමතක නොකරන්න. එය ඔවුනට මතකයේ සිටින දිනයක් වීමට සැලසුම් කරන්න.

- නත්තලේ නාමයෙන් මත්පැන් ප්‍රතික්ෂප කරන්න.

## C. **ඉරුදින පාසල් සඳහා**

- එක්වරම ළමයින්ගේ ප්‍රීතිය සහ බලාපෙරොත්තු කපා නොදමන්න. ඉරුදින පාසල් ළමයින් සඳහා නත්තල් සීයා (santa clause) පිළිබඳව සැබෑ කරුණු එනම් සාන්ත නිකොලස්තුමා, තමන්ගේ අනන්‍යතාවය හෙළි නොකර දුප්පත් සහ අවශ්‍යතා ඇති ළමයින්ට උදව් කළේය යන්න උගන්වන්න. එමෙන්ම අවශ්‍යතා ඇති අයට සහ දුප්පතුන්ට උදව් කිරීම අවධාරණයෙන් පැහැදිලි කරදීමට විශේෂ පන්ති වාරයක් පවත්වන්න.

- ඉරුදින පාසල් උත්සව අන්තර් ක්‍රියාකාරී (Interactive) සහ ප්‍රීතිමත් කරනවා පමණක් නොව ඒවා තුළින් නත්තලේ සැබෑ අර්ථය එළිදක්වීමක් ද කරන්න. අසල්වාසින්ගෙන් ළමයින් කිහිපදෙනෙකුට ආරාධනා කරන්න.

- නත්තල් කාලයේ දී උපකාර අවශ්‍ය මිතුරෙකුට/මිතුරියකුට උදව් කිරීමට උනන්දු කරන්න.

## D. **නත්තල් කාලයේ දී සැරසිලි**

- පොලිතින් පාවිච්චියෙන් වළකින්න.

- නත්තල් ගස අත්‍යවශ්‍ය නොවේ. ඔබට අවශ්‍ය නම් ජීවමාන ගසක් සරසන්න. අතු කපන්න හෝ කෘතිම ගස් පාවිච්චි කරන්න එපා.

## E. **විද්‍යුත් තැපැල්** (online) **පෙත්සම**

- නත්තල සරලත්වයෙන් සහ අධ්‍යාත්මක උපදේශයක් ඇති වන ආකාරයෙන් පැවැත්වීමට උදව් වී මෙම ව්‍යාපාරයට එකතු වන ලෙස රාජ්‍යයෙන් සහ ව්‍යාපාරික ආයතනයන්ගෙන් ඉල්ලුම් කරන විද්‍යුත් තැපැල් පෙත්සමක් සැකසෙනවා ඇත. එයට විශ්වාසවන්තයින් වන බවටද දායකවිය හැක.

- ඔබ නත්තල ජේසුස් ක්‍රිස්තුස් සමිඳාණන්ගේ වැඩ විසීම සැබවින් අත්දකින්න අර්ථවත්, ප්‍රීතිමත් සමයක් කිරීම සඳහා ඔබගේ නොමසුරු සහයෝගය ලබා දේවි යැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය**
368/6, බෞද්ධාලෝක මාවත
කොළඹ 7

දුරකථන: 0112671723
ෆැක්ස්: 0112671721
විද්‍යුත් තැපෑල: info@nccsl.org